# දකුණු පළාත් අභ්‍යන්තර විගණන දෙපාර්තමේන්තුවේ විගණන තනතුරු සඳහා බඳවා ගැනීමේ ව්‍යවස්ථා සංග්‍රහය.

01. **හැඳින්වීම :-**

දකුණු පළාත් සභාව තුල පළාත් සභාව මගින් පවත්වා ගෙන යනු ලබන රජයේ ආයතනවල පරිපාලන හා මූල්‍ය කටයුතු පිළිබඳ විගණන සඳහා අභ්‍යන්තර විගණන දෙපාර්තමේන්තුවක් ස්ථාපිත කරන අතර ඒ සඳහා අවශ්‍ය විගණන නිලධාරීන් බඳවා ගැනීම මෙම ව්‍යවස්ථාවේ විධිවිධාන වලට අනුකූලව ක්‍රියාත්මක කරනු ලැබේ.

02. **ක්‍රියාත්මක වන දිනය :-**

මෙම ව්‍යවස්ථාව දකුණු පළාත් ගරු ආණ්ඩුකාරතුමාගේ අනුමැතිය ලත් දින සිට ක්‍රියාත්මක වන්නේය.

03. **ව්‍යුහය :-**

මෙම විගණන දෙපාර්තමේන්තුවේ සේවයේ තනතුරු පහත පරිදි නම් කරනු ලැබේ.

| පන්තිය | තනතුරු නාමය | තනතුරු සංඛ්‍යාව |
|---|---|---|
| අභ්‍යන්තර විගණන සේවය i | අධ්‍යක්ෂ | 01 |
| අභ්‍යන්තර විගණන සේවය ii | නියෝජ්‍ය අධ්‍යක්ෂ | 01 |
| අභ්‍යන්තර විගණන සේවය iii | ජ්‍යෙෂ්ඨ විගණන නිලධාරි | 02 |
| අභ්‍යන්තර විගණන සේවය iv | විගණන නිලධාරී | 23 |
| | අංශ ප්‍රධානි ( කළමනාකරණ සහකාර 1) | 01 |
| | කළමනාකරණ සහකාර | 02 |
| | සංවර්ධන සහකාර | 01 |
| | කා.කා.ස. | 01 |
| | රියදුරු | 02 |

අභ්‍යන්තර විගණන සේවයේ i සිට iv දක්වා වූ විගණන ශ්‍රේණි වලින් සමන්විත වේ.

04. **වාර්ෂික ඒකාබද්ධ වැටුප් පරිමාණය :-**

ඉහත 03 ඡේදයේ සඳහන් තනතුරු වලට බඳවා ගනු ලබන්නේ පහත දක්වා ඇති පරිදි සුදුසුකම් සම්පූර්ණ කර ඇති දැනටමත් පළාත් රාජ්‍ය සේවයේ නිත්‍ය තනතුරු දරණ පුද්ගලයන්ගෙන් බැවින්, ඒ ඒ නිත්‍ය තනතුරුවල ලබමින් සිටි වැටුප් ක්‍රමයන් හා වැටුප් තලයන් තවදුරටත් ක්‍රියාත්මක කරනු ලැබේ.

05. **සේවක සංඛ්‍යාව :-**

ඉහත 03 ඡේදයේ සඳහන් පරිදි සේවක සංඛ්‍යාව දැනට සීමා වෙනු ඇත. සේවයේ අවශ්‍යතාවය මත මෙම සේවක සංඛ්‍යාව සංශෝධනය කළ හැකිය.

06. **පාලනය:-**

දකුණු පළාත් අභ්‍යන්තර විගණන දෙපාර්තමේන්තුව දකුණු පළාත් ප්‍රධාන ලේකම් යටතේ පාලනය වන අතර දකුණු පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ සහ ගරු ආණ්ඩුකාරතුමාගේ අධීක්ෂණයට යටත් වනු ඇත.

07. **පොදු සුදුසුකම් :-**

1. වයස අවු : 50 නොඉක්ම විය යුතුය.
2. දකුණු පළාතේ ස්ථිර පදිංචි කරුවකු වීම.
3. සේවා කාලය තුල විනයාණුකූල දඩුවම් කිසිවක් ලබා නොතිබිය යුතුය.
4. දකුණු පළාත් රාජ්‍ය සේවයේ නියුතු අය විය යුතුය.

08. **බඳවා ගැනීම් / අන්තර්ග්‍රහණය කිරීම් :-**

8.1 විගණන සේවයේ 1 ශ්‍රේණිය ( අධ්‍යක්ෂ )

8.2 සුදුසුකම් හා බඳවා ගැනීම.

(අ) දකුණු පළාත් සභාව තුල සේවය කරන පළාත් රාජ්‍ය සේවයේ ශ්‍රී.ලං.ග.සේ. 1 පන්තියේ නිලධාරීන්ගෙන් අයදුම්පත් කැඳවීම.

(ආ) රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් පත් කරනු ලබන සම්මුඛ පරීක්ෂණ මණ්ඩලයක් මගින් සම්මුඛ පරීක්ෂණ පැවැත්වීම.

(ඇ) තෝරා ගන්නා නිලධාරියා දකුණු පළාත් විගණන දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ වශයෙන් පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් පත් කිරීම.

8.1.2 මෙම ව්‍යවස්ථව ක්‍රියාත්මක වන දිනට දැනටමත් පත් වී සිටින අභ්‍යන්තර විගණන අධ්‍යක්ෂ එම තනතුරු නාමයෙන් ම මෙම ව්‍යස්ථාව යටතේ අන්තර් ග්‍රහණය කරනු ලැබේ.

8.1.3 විගණන අධ්‍යක්ෂගේ සේවා කාලය අවසන් වනුයේ ඔහු වෙනත් තනතුරකට උසස් කර විධිමත් පත්වීම් ලිපියක් නිකුත් කිරීමෙන්, විශ්‍රාම යාමෙන්, තම අභිමතය පරිදි ලිත් මසක් කල් දී ඉල්ලීමක් කිරීමෙන් පසු විධිමත් ලෙස තම නිත්‍ය තනතුරට නිදහස් කිරීමෙන් හෝ වෙනත් නිත්‍යානුකූල හේතුවක් මත සේවය අහෝසි කිරීමෙනි.

09. **නියෝජ්‍ය අධ්‍යක්ෂ තනතුර ( විගණන සේවයේ ii ශ්‍රේණිය ) සුදුසුකම් හා බඳවා ගැනීම.**

9.1 (අ) දකුණු පළාත් සභාව තුල සේවය කරන ශ්‍රී.ලං.ග.සේ. ii/i පන්තියේ නිලධාරීන්ගෙන් අයදුම්පත් කැඳවීම.

(ආ) රා.සේ.කො. සභාව විසින් පත් කරනු ලබන පරීක්ෂණ මණ්ඩලයක් විසින් සම්මුඛ පරීක්ෂණයක් පැවැත්වීම.

(ඇ) තෝරා පත් කර ගන්නා නිලධාරියා දකුණු පළාත් විගණන දෙපාර්තමේන්තුවේ නියෝජ්‍ය අධ්‍යක්ෂ ලෙස දකුණු පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් පත් කිරීම.

10. **විගණන සේවය iii වන ශ්‍රේණියේ ජ්‍යෙෂ්ඨ විගණන නිලධාරී**

10.1 සුදුසුකම් හා බඳවා ගැනීම.

දැනට ප්‍රධාන ලේකම් කාර්යාලයේ අභ්‍යන්තර විගණන අංශයේ සේවය කරන අභ්‍යන්තර විගණන නිලධාරීන් අවසාන වශයෙන් ඉදිරි වර්ෂ 05 සඳහා අන්තර්ග්‍රහණය කිරීමෙන් පසු ඉන් දෙදෙනෙකු පළපුරුද්ද අධ්‍යාපන හා වෘත්තීය සුදුසුකම් අනුව විගණන අධ්‍යක්ෂ / ප්‍රධාන ලේකම්ගේ අභිමතය පරිදි iii ශ්‍රේණියේ ජ්‍යෙෂ්ඨ විගණන නිලධාරීන් ලෙස පත් කරනු ලැබේ. නමුත් ඔවුන් ලබා ගන්නා වැටුපේ හෝ වැටුප් ක්‍රමයේ කිසි වෙනසක් සිදු නොවන අතර, ඔවුන් එදිනට ලබන වැටුප හා වැටුප් ක්‍රමය තවදුරටත් ඒ ආකාරයෙන් ම අදාළ වන්නේය. මෙම තනතුරු පුරප්පාඩු වූ විට iv ශ්‍රේණියේ විගණන නිලධාරීන් අතුරින් ජ්‍යෂ්ඨතාවය සහ කුසලතාවය මත තෝරා ගනු ලැබේ. කුසලතාවය තීරණය කරනු ලබන්නේ, විගණන කටයුතු සම්බන්ධව දක්වා ඇති විශේෂ හැකියාවන් හා ලබා ඇති උසස් මට්ටමේ ප්‍රතිඵල පදනම් කර ගෙනය.

11. <u>විගණන ශ්‍රේණියේ iv ශ්‍රේණියේ විගණන නිලධාරී</u>
<u>සුදුසුකම් හා බඳවා ගැනීම .</u>

දකුණු පළාත් ප්‍රධාන ලේකම් විසින් පහත සඳහන් සුදුසුකම් ඇති අයගෙන් ඉල්ලුම්පත් කැඳවා "අ "පරිශිෂ්ඨය පරිදි විභාග කොමසාරිස් ජනරාල් හෝ ද/ පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් පවත්වනු ලබන විභාගයේ ප්‍රතිඵල මත තෝරා ගැනීම සිදු කරනු ලැබේ.

11.1 (අ) අයදුම්පත් භාර ගන්නා අවසන් දිනට වර්ෂ 5 ක විගණන / ගිණුම් කටයුතු පිළිබඳ පලපුරුද්දක් සහිත වර්ෂ 10 ක සේවා කාලයක් හිමි, දකුණු පළාත් රාජ්‍ය සේවයේ i වන පන්තියේ කළමනාකරණ සහකාර සේවා වලට අයත් නිලධාරීන් හෝ උපාධිධාරී වැඩසටහන් සහකාර, උපාධිධාරී සංවර්ධන සහකාර සේවයට අයත් නිලධාරීන් මෙම විභාගයට පෙනී සිටීමට සුදුසුකම් ලබනු ඇත.

(ආ) ඉල්ලුම්පත් භාර ගන්නා අවසාන දිනට පූර්වාසන්න වසර 05 තුල සියලුම වැටුප් වර්ධක උපයාගෙන තිබීම.

හෝ

11.2 පහත සඳහන් අධ්‍යාපනික / වෘත්තීය සුදුසුකම් වලින් එකක් ලබා ඇති සහ අයදුම්පත් භාර ගන්නා අවසාන දිනට වර්ෂ 02 ක විගණන / ගිණුම් පිළිබඳ පලපුරුද්දක් සහිත වර්ෂ 03 ක සේවා කාලයක් ඇති දකුණු පළාත් රාජ්‍ය සේවයේ නියුක්ත නිලධාරියෙකු විය යුතු අතර පූර්වාසන්න වර්ෂ 03 ක කාලයක් තුල සියලුම වැටුප් වර්ධක උපයා ගෙන තිබීම.

1. පිළිගත් විශ්ව විද්‍යාලයක ගණකාධිකරණය, වාණිජ්‍යය, ව්‍යාපාර / රාජ්‍ය කළමනාකරණය විෂයයන් සහිත උපාධියක් සමත්ව තිබීම හෝ ආර්ථික විද්‍යාව විශේෂ උපාධියක් තිබීම.
2. ගණිතය, රාජ්‍ය මූල්‍ය හා බදුකරණය හෝ සමාන ක්ෂේත්‍රයක විද්‍යාවේදී උපාධියක් සමත් ව තිබීම හෝ
3. පිළිගත් ගණකාධිකරණ ආයතනයක ආවසරික හෝ මධ්‍ය පරීක්ෂණය සමත්ව තිබීම හෝ
4. උසස් අධ්‍යාපන අමාත්‍යාංශය යටතේ ඇති කාර්මික විද්‍යාලයක හෝ බහු තාක්ෂණ ආයතනයක උසස් ජාතික ගණකාධිකරණය ඩිප්ලෝමාව සමත් වී තිබීම.

*11.3* විගණන නිලධාරී iv පන්තියේ තනතුරු වලින් එකක් ද/ පළාත් තාක්ෂණ සේවයේ පහත සඳහන් සුදුසුකම් ඇති නිලධාරියෙකු ගෙන් පුරවනු ලැබේ.

<u>සුදුසුකම් :</u>
1. ශ්‍රී ලංකා පුරවැසියෙක් වන දකුණු පළාතේ පදිංචිය ඇති දකුණු පළාත් රාජ්‍ය සේවයේ අයෙකු වීම.
2. දකුණු පළාත් තාක්ෂණ සේවයේ 1 වන පන්තියේ නිලධාරියෙකු වීම.
3. වාරි මාර්ග දෙපාර්තමේන්තුවේ හෝ ගොඩනැගිලි / ඉංජිනේරු සේවා දෙපාර්තමේන්තුවේ හෝ වර්ෂ 05 කට නොඅඩු ඉදි කිරීම හා නිර්මාණ පිළිබඳ පළපුරුද්දක් ලබා තිබිය යුතුය.

අනුමත අංකය:- 208
2007.03.04
06
2007.04.03

(3)

**11.4 පොදු කරුණු :-**

1. වයස අවු : 50 නොඉක්මවිය යුතුය.
2. දකුණු පළාතේ ස්ථිර පදිංචිකරුවකු වීම.
3. සේවා කාලය තුල විනයානුකූල දඬුවම් කිසිවක් ලබා නොතිබිය යුතුය.

**12. අංශ ප්‍රධාන, කළමනාකරණ සහකාර, සංවර්ධන සහකාර, කා.කා.ස. හා රියදුරු:**

ප්‍රධාන ලේකම් විසින් පළාත් රාජ්‍ය සේවයේ නිලධාරීන්ගෙන් අන්තර් ග්‍රහණය කරනු ලැබේ.

**13. සේවා කොන්දේසි :-**

1. අධ්‍යක්ෂ තනතුරු හැර අභ්‍යන්තර විගණන සේවයේ අනෙකුත් සියලුම තනතුරුවලට බඳවා ගන්නා නිලධාරීන්ගේ සේවා කාලය උපරිම වශයෙන් අවු 05 කට සීමා වනු ඇත.
2. දකුණු පළාත් අභ්‍යන්තර විගණන දෙපාර්තමේන්තුවේ පත්වීම් ලබන නිලධාරීයෙක් පත්වීම් ලද දිනයේ සිට එම සේවයෙන් නිදහස් කරනතාක් වෙනත් කිසිදු සේවයකට අයත් නොවිය යුතුය.

**14. අන්තර් විධිවිධාන :-**

අභ්‍යන්තර විගණන අංශයේ දැනටමත් සිටින නිලධාරීන්ගේ සේවා කාලය මෙම ව්‍යවස්ථාව ක්‍රියාත්මක වන දින සිට වසර 05 කට සීමා වනු ඇත.

**15.** මෙම බඳවා ගැනීමේ ව්‍යවස්ථාව මගින් විධිවිධාන සලසා නොමැති කිසියම් කරුණක් වෙතොත් ඒ ගැන දකුණු පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් කරනු ලබන නිර්දේශ මත ගරු ආණ්ඩුකාරතුමා/ තුමිය විසින් තීරණය කරනු ලබන අතර, එය අවසානාත්මක වන්නේ ය.

2007/03/06

අනුමත අංකය :- 208
දකුණු පළාතේ ගරු ... 2007.04.03
... 06
2007.04.0

## " අ " පරිශිෂ්ඨය

සේවා ව්‍යවස්ථාවේ 11 වන ඡේදයේ සඳහන් පරිදි අභ්‍යන්තර විගණන නිලධාරී 1v පන්තියට අන්තර් ග්‍රහණය කිරීම සඳහා වන තරඟ විභාගය - විභාග පරිපාටිය.

(අ) <u>ලිඛිත පරීක්ෂණය :-</u>

මෙ සඳහා පහත සඳහන් විෂයයන් වෙනුවෙන් පැය 03 බැගින් වූ ප්‍රශ්ණ පත්‍ර 03 කට පිළිතුරු සැපයිය යුතුය.

1. ගණකාධිකරණය
11. විගණනය
111. මුදල් රෙගුලාසි, ආයතන සංග්‍රහය හා රාජ්‍ය මූල්‍ය කළමනාකරණය

### 1. <u>ගණකාධිකරණය</u>

පහත සඳහන් විෂයයන් පිළිබඳ පැය 03 ක එක් ප්‍රශ්න පත්‍රයකි.

- ගණකාධිකරණය න්‍යාය - මූලික සංකල්ප, මූලධර්ම, ද්විත්ව සටහන්, පිරිවැය වර්ගීකරණය, ශේෂ පත්‍රවල තොරතුරු වර්ගීකරණය, නිෂ්පාදන, වෙළඳ හා ලාභාලාභ ගිණුම් පිළිබඳ සාමාන්‍ය අවබෝධය.
- ගණකාධිකරණය පද්ධති - දෛනික පොත්, ලෙජර්, පාලන ගිණුම්, ව්‍යාපාරික ගණුදෙනු විශ්ලේෂනය, මිලදී ගැනීම, වෙළදාම, මුදල් ලැබීම, හා ගෙවීම , තොග පාලනය ආදී මූලික කළමනාකරණ කාර්ය භාරයන්ට අදාල පරිපාටි පිළිබඳ නිපුනත්වය.
- අවසාන ගිණුම් සකස් කිරීම - නිෂ්පාදන , වෙළද, ලාභාලාභ ගිණුම්, ආදායම් සහ වියදම් ගිණුම් , සැසඳීම් ප්‍රකාශ, ගණක සහ සංඛ්‍යාන අනුපාතයන් ශේෂ පත්‍රය සකස් කිරීම, තනි සටහන් හා අසම්පූර්ණ වාර්තා ආශ්‍රයෙන් ගිණුම් සෑදීම ඇතුළත් ගණකාධිකරණ ව්‍යවහාරයේ ගැටළු.
- විවිධ පාලන ගිණුම් - බැංකු සැසැදුම් විස්තර, ණය ගැති, ණය හිමි පාලන ගිණුම්, උපලබ්ධි ගිණුම් ආදිය
- පිරිවැය ගණකාධිකරණය මූලධර්ම - පිරිවැයකරණ වර්ග, ද්‍රව්‍ය මිලදී ගැනීම හා ගබඩා පරිපාටි , තොග පාලනය, ස්ථාවර හා විචල්‍ය වියදම්, ඍජු හා වක්‍ර වියදම්, ඇස්වැය ලේඛණමය පාලනය, ආන්තික පිරිවැයකරණය.

### 11. <u>විගණනය.</u>

පහත සඳහන් විෂයයන් පිළිබඳව පැය 03 ක එක් ප්‍රශ්න පත්‍රයකි.

- විගණන සංකල්ප හා න්‍යාය - විගණනයක අවශ්‍යතාවය, ගණන්දීමේ වගකීම, විගණන විෂය පථය, විගණන වර්ග, විගණන කාල තීරණය, විගණනකරුවන්ගේ සුදුසුකම්, බලතල, විගණනය සඳහා අධිකාරී බලය, පූර්ව විගණනය, අභ්‍යන්තර සෝදිසිය, අභ්‍යන්තර පාලනය, ගැඹුරින් විගණනය, ප්‍රමිති සඳහා වන අවශ්‍යතාවය, විගණනය සඳහා සාක්ෂි වර්ග, විගණන ශිල්පී ක්‍රම.

අනුමත අංකය:- 208 5

2007.03.06

2007.04.03

06

2007.04.03

- විගණන පද්ධති හා පරිපාටි - ශේෂ පත්‍රය, නිෂ්පාදන වෙළඳ හා ලාභලාභ ගිණුම විෂයයන්, ස්ථාවර වත්කම්, ජංගම වත්කම්, විකුණුම්, මිලදී ගැනීම්, ලැබීම්, ගෙවීම් ආදිය ආවරණය වන විගණන වැඩ සටහන් පිළිබඳ නිපුනත්වය.
- විගණන ගැටළු - නිරීක්ෂණ හැකියාවන් සහ වැරදි හා අසාමාන්‍ය අවස්ථාවන් සොයා බැලීමේ හැකියාව, පිරික්සීම සඳහා වන සරල ගැටළු.
- විගණකාධිපතිවරයාගේ කාර්යයන් හා බලතල

111. මුදල් රෙගුලාසි, ආයතන සංග්‍රහය හා රාජ්‍ය මූල්‍ය කළමනාකරණය.
පහත සඳහන් විෂයයන් පිළිබඳ ව පැය 03 ක එක් ප්‍රශ්න පත්‍රයකි.

- ශ්‍රී ලංකා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ මූල්‍ය කළමනාකරණ විධිවිධාන.
- පළාත් සභා ආදායම් පනත
- දකුණු පළාත් මුදල් රීති,රජයේ මුදල් රෙගුලාසි පිළිබඳ දැනුම
- පළාත් පාලන මූල්‍ය කාර්ය පරිපාටිය
- ගබඩා සහ ටෙන්ඩර් පරිපාටි
- අග්‍රිම හා අත්තිකාරම්
- ආයතන සංග්‍රහයේ 1 හා 11 කොටස්
- භාණ්ඩාගාර හා මුදල් චක්‍රලේඛ

(ආ) ලකුණු දීමේ ක්‍රමය :-

1. ලිඛිත පරීක්ෂණය සඳහා ගණකාධිකාරණය, විගණන හා මුදල් රෙගුලාසි, ආයතන සංග්‍රහය හා රාජ්‍ය මූල්‍ය කළමනාකරණය යන ප්‍රශ්න පත්‍ර සඳහා එකකට ලකුණු 150 බැගින් වේ. වාචික පරීක්ෂණය සඳහා සුදුසුකම් ලැබීමට අයදුම්කරුවන් විසින් එක් එක් ප්‍රශ්න පත්‍රයට අවම වශයෙන් සියයට 40 ක් ද සියයට 50 ක සාමාන්‍යයක් ද ලබා ගත යුතුය.
2. වාචික පරීක්ෂණය මූලික සුදුසුකම් පරීක්ෂා කිරීම සඳහා පමණක් කරනු ඇත.

(ඇ) අයදුම්කරුවන් තෝරා ගනු ලබන්නේ, ඔවුන් විසින් ලිඛිත විභාගයේදී ලබා ගන්නා ලද මුළු ලකුණු හා වාචික පරීක්ෂණයේදී මූලික සුදුසුකම් ඇති අයගෙන් ඇති වන පුරප්පාඩු ගණන පදනම මත වේ.

0

සහතික කළ ... 2007/03/08

අනුමත අංකය:- 208
දකුණු පළාත් ... 2007.04.02 ...
... 06 ...
2007.04.03